## දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය

### දකුණු පළාත් සහා සිංහල මාධ්‍ය පාසල්වල පවතින විශේෂ අධ්‍යාපන, භාෂාමය විෂයන්හි (ප්‍රංශ භාෂාව, කොරියන් සහ ජපන් භාෂාව) ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරින්, ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම - 2021

දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති සිංහල මාධ්‍ය පාසල් වල විශේෂ අධ්‍යාපන, භාෂාමය විෂයන්හි (ප්‍රංශ භාෂාව,කොරියන් භාෂාව සහ ජපන් භාෂාව) පවත්නා ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම පිණිස සුදුසුකම්ලත් උපාධිධාරින්ගෙන්, ඩිප්ලෝමාධාරීන්ගෙන් මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** ***සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :-***

2.1 දකුණු පළාත් සහා පාසල් වල පවතින ගුරු පුරප්පාඩු වෙනුවෙන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා ඇති උපාධිධාරීන්ට, ඩිප්ලෝමාධාරීන්ට අයදුම් කළ හැකි ය.

2.2 2008.07.01 දින සිට ක්‍රියාත්මක නව ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 7.2.4.4.1 වගන්තිය අනුව දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට සහ ප්‍රායෝගික පරීක්ෂණයට යොමු කර එම පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන්ගෙන් පමණක් පහතින් දක්වා ඇති ආකාරයට බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

2.3 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මාර්ගගත ක්‍රමය හරහා ලැබෙන අයදුම්පත් අනුව ඉහත 2.2 හි දක්වා ඇති පරීක්ෂණයන්ගෙන් සුදුසුකම්ලත් (සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය සමත්වන) අයදුම්කරුවන් දකුණු පළාතේ අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් බඳවා ගැනීමට අපේක්ෂා කෙරේ. අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල ස්ථිර පදිංචි අයදුම්කරුවන් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාසල්වල ඇබෑර්තු සම්පූර්ණ කිරීමේ දී ප්‍රථමයෙන් බඳවා ගනු ලැබේ. යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ස්ථිර පදිංචිය ඇති (මෙම නිවේදනයේ 7 හි II ඡේදයේ දක්වා ඇති පරිදි) සුදුසුකම්ලත් අයදුම්කරුවන් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් නොමැති නම් ප්‍රථමයෙන් ආසන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලින් ද දෙවනුව ඊළඟ ආසන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලින්ද සුදුසුකම් සහිත අපේක්ෂකයින් තෝරාගනු ලැබේ.

2.4 බඳවා ගැනීම් සිදුකරන සෑම පියවරකදීම බඳවා ගන්නා විෂයයට අදාළ සුදුසුකම් සහිත අයදුම්කරුවන් අතරින් (මෙම නිවේදනයේ 5.1 හා 5.2හි සඳහන් පරිදි) පන්ති සාමාර්ථ සහිත අයදුම්කරුවන් බඳවා ගැනීම ප්‍රථමයෙන් සිදු කරනු ලබන අතර ඉන් පසු පිළිවෙලින් උපාධිධාරීන් ද ඉන් පසු ඩිප්ලෝමාධාරීන් ද බඳවා ගනු ලැබේ.

2.5 උසස් පෙළ සමතුන් සඳහා ගුරු සහායක පත්වීම් ලබා දීමට අපේක්ෂිත අතර එසේ බඳවාගනු ලබන ගුරු සහායකයින් ස්වකීය පළමු පත්වීම් දිනයේ සිට වසර 05ක් ඇතුලත තමන් පත් කළ විෂයයට අදාළ ව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන ගුරු පුහුණුවක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් අදාළ විෂයයට උපාධියක් ලබා ගත යුතු අතර එම ගුරු පුහුණුව හෝ උපාධිය වලංගු වන දින සිට ඔහු/ඇය ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ 1 ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කොට සේවය ස්ථිර කරනු ලැබේ.

වසර පහක් (05) ඇතුළත ඉහත 2.5හි සඳහන් සුදුසුකම් සපුරා ගැනීමට අපොහොසත් වන ගුරු සහායකවරුන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

2.6 දකුණු පළාත් ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.4.4.1 (1) හි දැක්වෙන පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් යොමු කරනු ලැබේ.

2.7 විශ්‍රාම යාම, වෙනත් පළාතකට ස්ථාන මාරුවීයාම, වෙනත් සේවයක උසස්වීම් ලැබීම හේතුවෙන් ඇතිවන ගුරු පුරප්පාඩු ද මේ යටතේ සම්පූර්ණ කිරීමට අපේක්ෂිත අතර, එහිදී ඇති වන ඇබෑර්තු සම්පූර්ණ කිරීම ද ඉහත 2.1, 2.2, 2.3, 2.4, 2.5සහ 2.6 අනුව සිදු කෙරේ.

**03.** ***සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-***

3.1 මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ.

3.2 මුලින් පත්වීම් ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අවම වශයෙන් වසර 05 ක් සේවය කළ යුතු වේ.

3.3 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තු අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත්වේ.

3.4 උසස් වීම් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ සිදුකරනු ඇත.

3.5 උපාධිය හෝ ඩිප්ලෝමාවට අදාළ විෂයයන් යටතේ අයදුම්කළ යුතු අතර, පත්වීම් විෂයය කිසිදු හේතුවක් නිසා වෙනස් කරනු නොලැබේ.

3.6 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

04. ***වැටුප් පරිමාණය :-***

4.1 උපාධිධාරී අයදුම්කරුවන්

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව මෙම පත්වීමට හිමි වැටුප් ක්‍රමය වන G-E-01-2016 දරණ වැටුප් කාණ්ඩය (මාසික රු. 27,740 – 6x300 – 7x380 – 9x445 – 36,205 ක්) වේ. ඔබ මෙම වැටුප් පරිමාණයේ 14 වන පියවර වන රු. 32,200.00 ක මාසික වැටුප මත පිහිටුවනු ලැබේ. මෙයට අමතර ව රජයේ නිලධරයින් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාවන් ද ඔබට හිමි ය.

4.2 ඩිප්ලෝමාධාරී අයදුම්කරුවන්

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය G-E-01-2016 දරණ වැටුප් කාණ්ඩය (මාසික වැටුප රු. 27,740 – 6x300 – 7x380 – 2x445 – 33,090 ක්) වේ. ඔබ මෙම වැටුප් පරිමාණයේ 07 වන පියවර වන රු. 29540.00 ක මාසික වැටුප මත පිහිටුවනු ලැබේ.

4.3 උසස් පෙළ සමත් අයදුම්කරුවන් (ගුරු සහායකයින් ලෙස බඳවාගැනීම)

ගුරු සහායකයින් ලෙස තෝරාගන්නා අයදුම්කරුවන් සඳහා සියලු දීමනා ඇතුලත් ව මසකට රු. 10,000 ක දීමනාවක් ගෙවනු ලැබේ.

05. ***අධ්‍යාපන සුදුසුකම් :-***

5.1 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පහත දැක්වෙන සුදුසුකම්, 2017.08.29 දිනැතිව ගරු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලද "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ III පරිශිෂ්ඨයේ දක්වා ඇති පරිදි ගුරුවරුන් රාජ්‍ය සේවයට බඳවා ගැනීම" යන මැයෙන් අධ්‍යාපන අමාත්‍යතුමා 2017.07.20 දිනැතිව ගරු අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශයේ යෝජනා අංක 2 හි දක්වා ඇති පරිදි සපුරා තිබිය යුතුය.

| **විෂයය** | | **සුදුසුකම්** |
|---|---|---|
| විශේෂ අධ්‍යාපන | විශේෂ අධ්‍යාපන ගුරුවරු | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් විශේෂ අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී උපාධියක් ලබා තිබීම.<br>හෝ<br>ජාතික අධ්‍යාපන ආයතනය හෝ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් විශේෂ අධ්‍යාපනය සඳහා ඩිප්ලෝමාවක් ලබා තිබීම. |
| | බ්‍රේල් මාධ්‍ය විශේෂ අධ්‍යාපන ගුරුවරු | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම උපාධියක් ලබා තිබීම හා බ්‍රේල් ලිවීමට හා කියවීමට ඇති හැකියාව<br>හෝ<br>පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනය මගින් බ්‍රේල් මාධ්‍යය පිළිබඳ ඩිප්ලෝමා හෝ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම. |

| | | |
|---|---|---|
| | සංඥා භාෂා විශේෂ අධ්‍යාපන ගුරුවරු | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් සංඥා භාෂාවේ සහාය ඇතිව තොල් පාඨනයෙන් උපාධියක් ලබා තිබීම<br><br>හෝ<br><br>පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සංඥා භාෂාව පිළිබඳ ඩිප්ලෝමා හෝ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.<br><br>හෝ<br><br>අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සමත්, සංඥා භාෂාව මගින් අධ්‍යාපනය ලබා දිය හැකි සුළු හෝ මධ්‍ය ශ්‍රවණාබාධිත පිරිස්. |
| භාෂාමය විෂයයන් (ප්‍රංශ, ජපන්,කොරියන්) | | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය/ විදේශීය විශ්වවිද්‍යාලයක් මගින් අදාළ විෂයය උපාධියට එක් විෂයක් ලෙස හදාරනු ලැබූ හෝ අදාළ විෂයට විශේෂ උපාධියක් ලබා තිබීම. |

5.2 අ.පො.ස.(සාමාන්‍ය පෙළ) දෙවරකට නොවැඩි වාර ගණනකදී මව්බස හා ගණිතය සමත්ව සම්මාන 3ක් ලබා විෂයයන් 6කින් සමත් වීම.

5.3 අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් එක්වරකදී විෂයයන් 3 කින් සමත්වීම.

06. ***වයස් සීමාව :-***

6.1 භාෂාමය විෂයන් (ප්‍රංශ භාෂාව සහ ජපන් භාෂාව) සඳහා -

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට **(2022.01.12 දිනට)** වයස,

අවම සීමාව : අවුරුදු 18

උපරිම සීමාව : අවුරුදු 35

ඒ අනුව 2004.01.12 වැනි දින හෝ ඊට පෙර හා 1987.01.12 වැනි දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

6.2 විශේෂ අධ්‍යාපන විෂය සඳහා -

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට **(2022.01.12 දිනට)** වයස,

අවම සීමාව : අවුරුදු 18

උපරිම සීමාව : අවුරුදු 40

ඒ අනුව 2004.01.12 වැනි දින හෝ ඊට පෙර හා 1982.01.12 වැනි දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

07. ***වෙනත් සුදුසුකම් :-***

I. අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතු ය.
II. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක දකුණු පළාතේ අඛණ්ඩ පදිංචිය හෝ පූර්වාසන්න වසර 03 ක කාලය තුල කලත්‍රයාගේ ස්ථිර පදිංචිය සමග අයදුම්කරුගේ පූර්වාසන්න එක් වසරක පදිංචිය තිබිය යුතු ය.
III. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.

08. ***අයදුම් කිරීමේ ක්‍රමය :-***

8.1 අයදුම්පත් පිරවීමේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංක හඳුනා ගැනීම සඳහා උපලේඛන 01 හි ඇති වගුව භාවිතා කරන්න. තවද තමා ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා අදාළ අංකය අයදුම්පත්‍රයේ නිවැරදිව සඳහන් කල යුතුය.

8.2 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021.01.12 දින හෝ ඊට පෙර දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ මාර්ගගත ද්වාරය හරහා (www.edumin.sp.gov.lk) ඉදිරිපත් කළ යුතු වේ. අදාළ අයදුම්පත ඔබ විසින් සාර්ථක ව සම්පූර්ණ කළ පසු එහි මෘදු පිටපත බාගත කිරීමේ හැකියාව පවතින අතර ම එය සුරක්ෂිත ව ළඟ තබා ගත යුතු වේ.

8.3 එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කල හැක්කේ එක් අයදුම්පතක් පමණක් වන අතර අයදුම් කළ හැක්කේ විෂයයන් 02ක් සඳහා පමණි.

8.4 අයදුම් කරනු ලබන විෂයය කිසිසේත් වෙනස් කළ නොහැකි අතර ඒ පිළිබඳ ව ඉදිරිපත් කරන අභියාචනා සලකා බලනු නොලැබේ.

8.5 විභාග ගාස්තු ලෙස රු.1000/= ක මුදලක් සම්මුඛ පරීක්ෂණයන් සඳහා පැමිණීමේ දී දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සරප් නිලධාරී මගින්, දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක 2003.2.13 දරණ අය ශීර්ෂයට ගෙවා ලදුපතක් ලබා ගත යුතු අතර එය සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

**09. *සම්මුඛ පරීක්ෂණය :-***

9.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය -
සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

සටහන 1 - ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු -
සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේ දැයි පරීක්ෂා කිරීම සහ කායික සුදුසුකම් පරීක්ෂා කිරීම.

9.2 ප්‍රායෝගික පරීක්ෂණය
අයදුම්කරු විසින් අයදුම්කරන විෂයයට අදාල හඳුනාගත් මාතෘකාවක් යටතේ විනාඩි පහක (05) ඉදිරිපත් කිරීමක් ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් සිදුකල යුතු වේ. මෙහිදී පහත පරිදි ලකුණු විසිපහක් (25) ලබා දෙනු ලැබේ.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිශ්ටවීම | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | 25 | 10 |

9.2.1 ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය

i. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා විනාඩි 5ක කාලයක් දෙනු ලැබේ.

ii. ප්‍රායෝගික පරීක්ෂණය ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහ (25) කි.

iii. ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබා ගත යුතු ය.

සටහන 2 - ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු -

ගුරු වෘත්තියේ දී වැදගත් වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ ව අයදුම්කරු සතු කුසලතා මැන බැලීම.

**10.** ***අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් :-***

10.1 අයදුම්පත පිරවීමේදී පහත උපලේඛන අංක 01පමණක් භාවිතා කල යුතු ය.\

උපලේඛනය 01

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | අංකය |
|---|---|
| අක්මීමන | -101 |
| අම්බලන්ගොඩ | -102 |
| බද්දේගම | -103 |
| බලපිටිය | -104 |
| බෙන්තොට | -105 |
| බෝපේ - පෝද්දල | -106 |
| ඇල්පිටිය | -107 |
| ගාල්ල | -108 |
| ගෝනපීනුවල | -109 |
| හබරාදූව | -110 |
| හික්කඩුව | -111 |
| ඉමදූව | -112 |
| කරන්දෙණිය | -113 |
| නාගොඩ | -114 |
| නෙළුව | -115 |
| නියාගම | -116 |
| තවලම | -117 |
| වැලිවිටිය - දිවිතුර | -118 |
| යක්කලමුල්ල | -119 |
| වඳුරඹ | -120 |
| රජ්ගම | -121 |
| මාදම්පාගම | -122 |
| අකුරැස්ස | -123 |
| අතුරලිය | -124 |
| දෙවිනුවර | -125 |
| දික්වැල්ල | -126 |
| හක්මන | -127 |
| කඹුරුපිටිය | -128 |
| කිරින්ද පුහුල්වැල්ල | -129 |
| කොටපොල | -130 |
| මාලිම්බඩ | -131 |
| මාතර | -132 |
| මුලටියන | -133 |
| පස්ගොඩ | -134 |
| පිටබැද්දර | -135 |
| තිහගොඩ | -136 |
| වැලිගම | -137 |
| වැලිපිටිය | -138 |
| අම්බලන්තොට | -139 |
| අඟුණකොලපැලැස්ස | -140 |
| බෙලිඅත්ත | -141 |
| හම්බන්තොට | -142 |
| කටුවන | -143 |
| ලුණුගම්වෙහෙර | -144 |
| ඕකෙවෙල | -145 |
| සූරියවැව | -146 |
| තංගල්ල | -147 |
| තිස්සමහාරාමය | -148 |
| වලස්මුල්ල | -149 |
| වීරකැටිය | -150 |

11. සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේ දී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳ ව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ.

12. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතික ඉදිරිපත් කළ යුතු වන අතර පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් බාර ගනු නොලැබේ.

13. මෙම නිවේදනයේ ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කිරීමේ අයිතියද, බඳවා ගැනීමේ ක්‍රමයට අදාළ කොන්දේසි සංශෝධන ද , කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම පිළිබඳව අවසන් තීරණය ගැනීම දකුණු පළාත් අධ්‍යාපන ලේකම් සතු වේ.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළකරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම් එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

**රංජිත් යාපා**
ලේකම්,
දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය.
2021 දෙසැම්බර් මස 29 වැනි දින